දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/04-01-43/04/2018
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2020.02.20

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla


25 FEB 2020

ලේකම්

ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශය

**දුම්රිය දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් පරීක්ෂක (යාන්ත්‍රික) තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය.**

උක්ත කරුණ සම්බන්ධව ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ ලේකම්ගේ MT/03/03/06 හා 2019.11.11 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද, එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් දුම්රිය දෙපාර්තමේන්තුවෙහි, අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික - අධි පන්තිය සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ මුල් පිටපත මේ සමඟ එවමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවා ගැනීමේ පටිපාටිය ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකරන ලෙසත් කාරුණිකව දන්වමි.

අත්/කළේ: ආර්.ඩී.පී.එස්.ධර්මසේන

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ

ලේකම් වෙනුවට

පිටපත් -

1. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව - කරු.දැ.ගැ.ස.
2. දුම්රිය සාමාන්‍යාධිකාරී - කරු.දැ.ගැ.ස.
3. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - කරු.දැ.ගැ.ස.

## දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික - අධි පන්තිය සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

1.1 දෙපාර්තමේන්තුව : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
යොමු අංකය : ප.06/140/2013 -දි.ප(යා) දිනය : 2018.07.03

1.2 අමාත්‍යාංශය : ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
යොමු අංකය : MT/03/03/06 දිනය : 2018.07.20

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම :
යොමු අංකය : DMS/F2/DR/01 දිනය : 2013.04.30

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :
යොමු අංකය : EST-2/02/REC/7513 දිනය : 2017.08.17

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : NSCC/02/43/SR දිනය : 2017.07.05

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :
යොමු අංකය : PSC/EST/04-01-43/04/2018 දිනය : 2018.11.15

**02.** පත්කිරීම් බලධරයා - රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03.** සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය: කළමනාකරණ සහකාර - අධි පන්තිය

3.2 ශ්‍රේණිය : විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

අනුමත තනතුරු සංඛ්‍යාවට සීමා වන පරිදි අභ්‍යන්තර බඳවා ගැනීමේ ක්‍රියාවලියක් මඟින් බඳවා ගනු ලබන, ජ්‍යෙෂ්ඨ විධායක හා විධායක නිලධාරීන්ගේ කාර්යභාරයට පරිපූරක/ සුසාධ්‍යකාරක/ උපස්ථම්භක වන පරිදි එම නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත්ව තනතුරු විශේෂිත කොට පවරා දෙනු ලබන පරිපාලනමය/ පිරිස් කළමනාකරණ සහ මූල්‍ය කළමනාකරණ කාර්යයන් පැවරෙන සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම - ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04.** තනතුරෙහි/තනතුරු වල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු ය.)

## 05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : MN07 – 2016

5.2 මාසික වැටුප් පරිමාණය : රු.41,580 – 11x755 – 18x1,030 – 68,425/-

5.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාල මාසික වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය(රු) |
|---|---|---|
| විශේෂ | පියවර 07 | රු:46,110 /- |

2016 සිට 2020 දක්වා වැටුප් ගෙවිය යුත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 උපලේඛන II හි සඳහන් පරිදි විය යුතුය.

## 06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| දිස්ත්‍රික් පරීක්ෂක (යාන්ත්‍රික) | 22 | දුම්රිය එන්ජින් රියදුරු, රියදුරු සහායක හා ෂන්ටින් එන්ජින් රියදුරු කාර්ය මණ්ඩල නිළකිරීම හා අධීක්ෂණය කිරීම, සේවා චක්‍ර සැදීම, පුහුණු කිරීම්, මූලික විමර්ශන පැවැත්වීම, යෝග්‍යතාවය සහතික කිරීම හා ධාවන කටයුතු පරීක්ෂා කිරීම, දුම්රිය ධාවනය අඛණ්ඩව පවත්වා ගැනීමට අවශ්‍ය වන මෙහෙයුම් ක්‍රියාවලියට හා ධාවනයට අවශ්‍ය වන ආකාරයට රියදුරු කාර්ය භාර නිළධාරීන්ගේ, දුම්රිය එන්ජින් රියදුරන්ගේ, ෂන්ටින් රියදුරන්ගේ, රියදුරු සහායකයින්ගේ කාර්යභාරය අධීක්ෂණය කිරීම, දුම්රිය එන්ජින් වල ධාවන පරීක්ෂාවන් කර ඒවා වාර්තා කිරීම, දුම්රිය සංඥා ස්ථානගත කිරීමේ කමිටුවල සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව: **22**

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාල නොවේ. |
| සීමිත | 100% |
| කුසලතා | අදාල නොවේ. |

7.2 විවෘත බඳවා ගැනීම: අදාළ නොවේ

7.3 සීමිත බඳවා ගැනීම:

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය: - විශේෂ ශ්‍රේණිය

7.3.2 සුදුසුකම්:

7.3.2.1 අධ්‍යයන සුදුසුකම්: අදාළ නොවේ.

7.3.2.2 වෘත්තීය සුදුසුකම්: විශේෂ පන්තියේ දුම්රිය එන්ජින් රියදුරෙකු වීම.

සටහන- මෙම බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට ඉහත 7.3.2.3 හි සුදුසුකම් සම්පූර්ණ කරන ලද විශේෂ පන්තියේ නිලධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති වන අවස්ථාවකදී, එම ඉතිරි වන පුරප්පාඩු සංඛ්‍යාව සඳහා දුම්රිය එන්ජින් රියදුරු I ශ්‍රේණියේ වසර 15ක සේවා කාලයක් සහිත පූර්වාසන්න වසර 5ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන් සලකා බලනු ලැබේ.

7.3.2.3 පළපුරුද්ද:

| තනතුර | පළපුරුද්ද |
|---|---|
| දිස්ත්‍රික් පරීක්ෂක (යාන්ත්‍රික) | දුම්රිය එන්ජින් රියදුරු විශේෂ පන්තියේ නිලධාරියෙකුවීම, පූර්වාසන්න අවුරුදු 05ක සතුටුදායක සේවා කාලයක් තිබීම, නාවලපිටිය ධාවනාගාරයට අනුයුක්තව දුම්රිය එන්ජින් රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර 02ක කාලයක් එම කොට්ඨාශය තුළ දුම්රිය ධාවන රාජකාරීවල නිරතව වීම හා අහිතකර සේවයේ දුම්රිය එන්ජින් රියදුරෙකු ලෙස අවම වශයෙන් වසරක කාලයක් දුම්රිය ධාවන රාජකාරී වල නිරත වීම සපුරාලිය යුතුය. |

7.3.2.4 කායික සුදුසුකම්: සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත්: තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනයට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3 වයස: අදාළ නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය:

ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

7.3.4.1 ලිඛිත විභාගය: (ඇමුණුම 01 බලන්න)

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය | කාලය |
|---|---|---|---|
| අභියෝගතා පරීක්ෂණය | 100 | 40% | පැය 01 |
| කළමනාකරණය | 100 | 40% | පැය 03 |

7.3.4.1.1 පවත්වන බලධාරයා: දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල්

7.3.4.2 වෘත්තීය පරීක්ෂණ : අදාල නොවේ.

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

7.3.4.4 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ.

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : ''රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකිරීම හෝ අභ්‍යන්තර නිවේදනයක් මඟින් සහ වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.''

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම: අදාල නොවේ.

**08.** කාර්යක්ෂමතා කඩඉම් : අදාල නොවේ.

**09.** භාෂා ප්‍රවීණතාව : අදාල නොවේ.

**10.** ශ්‍රේණි උසස් කිරීම් : අදාල නොවේ.

**11.** තනතුරු වලට පත්කිරීම : අදාල නොවේ.

**12.** ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ දක්වා ඇති පොදු කොන්දේසි : අදාල වේ.

**13.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිරවන්නා වූ අර්ථ නිරූපණ :

"සක්‍රීය සේවා කාලය" යනු , වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

**14.** ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය: අදාල නොවේ.

**15.** සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්යය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධි විධාන අදාළ වේ.

**16.** මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධි විධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

**17.** අන්තර්කාලීන විධිවිධාන : අදාළ නොවේ.

සකස් කළේ : අත්සන : ..........

ජේ.යූ.එස්. ගුණවර්ධන
පරිපාලන නිලධාරී (පත්වීම්) ආවරණ
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
මරදාන, කොළඹ 10.

පරීක්ෂා කළේ : අත්සන : ..........

(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : ..........

තනතුර: ..........

දිනය : 2019 ..........

ජී. ගමගේ
අතිරේක සාමාන්‍යාධිකාරී (පරිපාලන)
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
කොළඹ 10.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ..........

තනතුර : ..........

නිල මුද්‍රාව : ..........

එම්. ජේ. ඩී. ප්‍රනාන්දු
දුම්රිය සාමාන්‍යාධිකාරී
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය
කොළඹ 10

දිනය : ..../10/19

---

යොමු අංකය : MT/03/03/06

2018.11.15 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දුම්රිය දොර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තාක්ෂණික අධි පන්තිය සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන: ..........

එල්. පී. ජයම්පති
ලේකම්
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
7 වන මහල, සෙත්සිරිපාය, (අදියර II)
බත්තරමුල්ල.

නම: ..........

ලේකම්

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

දිනය: 2019/11/11

නිල මුද්‍රාව : ..........

---

යොමු අංකය : PSC/EST/04-01-43/04/2018

දුම්රිය දෙපාර්තමේන්තුවේ හි අධීක්ෂණ කළමනාකරණ, තාක්ෂණික අධි පන්තිය සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2018.11.15 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..........

නම: එම්. ඒ. බී. දයා සෙනරත්

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල

දිනය: 2020/02/14

නිල මුද්‍රාව : ..........

* * *

ඇමුණුම 01

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් පරීක්ෂක (යාන්ත්‍රික) තනතුරට බඳවා ගැනීමේ ලිඛිත තරඟ විභාගය

01. විභාග පිළිබඳ විස්තර:

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| කළමනාකරණය | පැය 03 | 100 | 40% |

02. විභාගය පවත්වන ලබන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල්

03. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ වාර සීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාවය පරිදි වර්ෂයකට එක්වරක් පවත්වනු ලැබේ.

04. විභාගය සඳහා විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | තමා වෙත පැවරෙන කාර්යයන් සාමාන්‍ය කාර්ය සාධන මට්ටම ඉක්ම වූ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම, කුසලතා හා ආකල්ප අත්පත් කරගෙන තිබේ ද යන්න හා ඒවා භාවිතයේ දී ඉහළ ප්‍රවීණතාවයක් දක්වන්නේ ද යන්න මැන බැලීමේ පරීක්ෂණයකි. |
| කළමනාකරණය | 1.කළමනාකරණ මූලධර්ම,<br>11. කළමනාකරණ ශ්‍රිතයන් - සැලසුම් කිරීම, තීරණ ගැනීම, තීරණ ගැනීමේ ක්‍රියාවලිය, සංවිධානය, මාණ්ඩලිකරණය, මෙහෙයවීම, අභිප්‍රේරණ ක්‍රියාවලිය, නායකත්වය, පාලනය, පාලනමය ප්‍රතිපත්ති ක්‍රියාවලිය.<br>111. සහභාගිත්ව කළමනාකරණය<br>1V. කළමනාකරණ පරිසරය<br>V. සිද්ධි අධ්‍යයනය |

සකස් කළේ : අත්සන : ....................
(විෂයභාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : ..........ජේ.යූ.එස්. ගුණවර්ධන
තනතුර : .....පරිපාලන නිලධාරි (පාලන ආවරණ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව මරදාන, කොළඹ 10.
දිනය : ..........................

පරීක්ෂා කළේ : අත්සන : ....................
(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : ..........ජී. ගමගේ
තනතුර: .....අතිරේක සාමාන්‍යාධිකාරී (පරිපාලන) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව කොළඹ 10.
දිනය : ..2019. 10. 31.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.
අත්සන : ..........................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : ..........................
තනතුර : ..........................
දිනය : ......31/10/19
නිල මුද්‍රාව : ..........................

එම්. ජේ. ඩී. ප්‍රනාන්දු
දුම්රිය සාමාන්‍යාධිකාරී
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය
කොළඹ 10.